සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස-කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දක්වීමට අවසර ඇත

## ලියා දැන්වන වග

### අපරාධකාරයන් වීරයන් කිරීම

කිසිදු බුද්ධිමත් සමාජයක් සයිබර් අපරාධ සැහැල්ලුකොට සළකන්නේ නැත. ඒවා අනෙකුත් සංවිධානාත්මක අපරාධ සේම භයානක ය. විනාශකාරී ය. සමාජ විරෝධී ය. එනිසා සයිබර් අපරාධ වල නියැලෙන්නෝ දඬුවම් ලැබිය යුතු අපරාධකරුවෝ වෙති.

ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාගේ නිල වෙබ් අඩවියට ඇතුල් වී එහි ගොණු විකෘති කර දැමූ තරුණයන් දෙදෙනා අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් සමාජය තුළ කතිකාවක් ඇති වී තිබේ. මේ තරුණයන් දක්ෂයන් බැවින් ඔවුන් කළ අපරාධය නොතකා හැරිය යුතුය යන මතයක් ජනගත කිරීමට පිරිසක් කටයුතු කරමින් සිටිති. මේ තරුණයන් දක්ෂයන් නම් ඔවුන් කළ යුතුව තිබුණේ සිය දක්ෂතා සමාජ විරෝධි අපරාධයක් සඳහා යොදා ගැනීම නොවේ. දක්ෂයන් කළ යුත්තේ තම දැනුම සමාජ සුබසිද්ධිය සඳහා යොදවා ගැනීමයි.

සයිබර් අපරාධ අද මුලු ලොවටම හිසරදයක් වී ඇත. තමන්ට අයත් නැති වෙබ් අඩවි වලට හෙරෙන් රිංගා ඒවා විනාශ කිරීමත් කප්පම් ඉල්ලීමත් අද බහුල ලෙස සිදුවෙයි. (සන්නස වෙබ් අවඩියද තුන් වරක් මේ අපරා ධකරුවන්නේ ප්‍රහාර වලට ලක්විය) සයිබර් අපරාධ නිසා අපහසුතාවට පත්වූ පීඩාවට පත් වූ ආයතන මෙහි ඇති බරපතළ බව හොඳින් දනියි. මේ අපරාධ නැවැත්වීමේ වගකීමක් නීතිය රකින ආයතන වලට ඇති බවට විසල් හඬක් නැගෙන්නේ එනිසාය.

අපරාධයක් කරන්නා දක්ෂයෙක්ද නැද්ද යන්න නීතිය සහ යුක්තිය ඉදිරියෙහිදී වැදගත් නොවේ. වැදගත් වන්නේ කළ අපරාධය සහ එයට නීතියෙන් ලැබිය හැකි දඬුවම පමණකි. අපරාධකරුවන් වීරයන් කිරීමේ ප්‍රවණතාව දැන්වත් නවතා දැමිය යුතුය. එසේ නොවන කල අනෙකුත් අප-රාධකරුවන්ද එය ආදර්ශයට ගනිමින් ඉදිරියටම යනු ඇති බවට සැකයක් නැත.

සයිබර් අපරාධ හෝ වේවා වෙනයම් අපරාධ හෝ වේවා වරදකරුවන් ඒ වරද කරන්නේ දැනුවත්වමය. තමන් කරන්නේ දඬුවම් ලැබිය හැකි වරදක් බව ඒ අය දනිති. දැනුවත්ව වැරදි කරන්නන් වීරයන් වන්නේ නැත. සමාජ සුබසිද්ධිය අපේක්ෂා කරන්නෝ වෙත් නම් ඔවුන් කළ යුත්තේ අපරාධකරු-වන් වීරත්වයට ඔසවා තැබීම නොවේ.

# ඉදිරි ගමන



ශ්‍රීලනිප සම්මේලනය අඛණ්ඩව වසර විසි දෙකක්ම විධායක ජනාධිපති වරුන් තිදෙනෙකුගේ ප්‍රධානත්වයෙන් ජයග්‍රාහීව රැස්විය. මේ විශිෂ්ට ඉතිහාසය දැක දැක නැවත රටේ විධායක ජනාධිපති විය නොහැකි පුද්ගලයෙකුට පක්ෂය භාර දීමට කරන සටනක්ද මේ අතර ඉස්මතුවේ. ඒ කැරලි කරුවන් මෛත්‍රීට එරෙහිව නගන චෝදනා රැසකි. පක්ෂය අතහැර ගොස් මහින්ද ගෙදර යැවීමද, එක්සත් ජාතික පක්ෂය සමග ආණ්ඩුවක් තැනීමද, පසුගිය රජයේ දූෂණ වංචා සෙවීමද, වඩාත් කතාබහට ලක්ව ඇත. මේ සියල්ල පුද්ගලිකව සමහර විට මහින්ද රාජපක්ෂට අවාසිදායක විය හැකිය. එහෙත් ශ්‍රීලනිප පක්ෂ ව්‍යවස්ථාවට විධායක ජනාධිපති වරයා පළවා හැරිය නො හැකිය. ඒකාබද්ධ විපක්ෂයට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය නොහකිය.

මෛත්‍රීපාල සිරිසේන යනු 45 වසරක් තමන් ශක්තිමත් කළ පක්ෂයෙන් නික්ම ගොස් විධායක ජනාධිපති පදවියට පත් අසහාය පෞරුෂයකි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැරගිය පළමුවැන්නා මෛත්‍රී නොවේ. පක්ෂ නායකත්වයට උරුමකම් කී චන්ද්‍රිකා අනුර ආදි බණ්ඩාරනායක දරුවන් මෙන්ම මහින්ද

චන්ද්‍රසිරි සෙනෙවිරත්න



රාජපක්ෂද ශ්‍රීලනිපය හැර ගොස් නැවත පැමිණියෝ වෙති. අද මහින්ද කල්ලියේ ගැලවුම් කාරයා වන බැසිල් රාජපක්ෂ 1977දී ශ්‍රීලනිපය පැරදුණ පසුව, එජාපයට රිංගුවේය. ඔහු මුල්කිරිගල අතුරු මැතිවරණයේදී ශ්‍රීලනිපයට එරෙහිව එජාප ඡන්ද සටනද මෙහෙය වීය. ඔහු 2015 ජනවාරි 8 වෙනිදා රාත්‍රියේ පක්ෂයද සිය සොහොයුරාද අතහැර ඇමෙරිකාව සමග විදේශ ගතවිය. දිනේෂ් ගුණවර්ධන සිය පියාගේ පක්ෂය කුණු කූඩයට දමා මහින්දට කඬේ යමින් සිටියි. බන්දුල ගුණවර්ධන 2001දී ශ්‍රීලනිප ආණ්ඩුව පෙරළා දමා එජාපයට එක් විය. විමල් වීරවංශ මහින්ද චින්තන ආර්ථික ප්‍රතිපත්තියට එරෙහිව පළමු වෙඩි මුරය තැබූ කථිකයාය. උදය ගම්මන්පිල පාඨලී චම්පිකලා සමග මෛත්‍රී දිනවීමට පැරට බැස එක් රැයින් මහින්දට එකතු විය. පක්ෂයක්

8 වන පිටට